# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477421 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2026.05.15 |


## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2026 අප්‍රේල්

### 2026 අප්‍රේල් මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් නිෂ්පාදන සහ සේවා ක්‍රියාකාරකම්වල පහළ යෑමක් පෙන්නුම් කරයි

**පෙර වසර වල දී ද පැවති රටාවට අනුගත වෙමින්, නිෂ්පාදන අංශයේ ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2026 අප්‍රේල් මාසයේ දී දර්ශකාංක 42.6ක් දක්වා පහළ ගියේය.** සාමාන්‍යයෙන් ඉහළ දර්ශක අගයක් වාර්තා කරනු ලබන මාර්තු මාසයට සාපේක්ෂව සැලකීමේ දී, නව ඇණවුම්, නිෂ්පාදන, සේවා නියුක්ති සහ තොග මිලදී ගැනුම් උප දර්ශක පහළ යෑමෙහි ප්‍රතිඵලයක් ලෙස සමස්ත දර්ශකය පහළ ගියේය.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**
**42.6**
**2026 අප්‍රේල්**

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන්ට අනුව, විශේෂයෙන් ආහාර පාන නිෂ්පාදන සහ රෙදිපිළි සහ ඇඟලුම් නිෂ්පාදන යන අංශවල උත්සව සමයේ ඉල්ලුම ක්‍රමිකව පහළ යෑම, නව ඇණවුම් උප දර්ශකයේ පහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. සිංහල සහ දෙමළ අලුත් අවුරුදු සමය තුළ බොහෝ නිෂ්පාදන ආයතන වසා තැබීම හේතුවෙන් අප්‍රේල් මාසයේ වැඩ කරන දින ගණන අඩු වීම නිෂ්පාදන උප දර්ශකයේ පහළ යෑමට බොහෝ දුරට හේතු විය. පෙර වසරවල පැවති රටාවට අනුව උත්සව සමයේ කටයුතු සඳහා පැවති ඉහළ ශ්‍රම ඉල්ලුම අවසන් වීමෙන් පසු නිෂ්පාදකයින් තාවකාලික බඳවා ගැනීම් අඩු කිරීමත් සමඟ සේවා නියුක්ති උප දර්ශකය පහළ ගියේය. නව ඇණවුම් සහ නිෂ්පාදනයේ පහළ යෑම සමග තොග මිලදී ගැනීම් උප දර්ශකය ද පහළ ගියේය. මේ අතර, උත්සව සමයේ පැවති බාධා සහ මැද පෙරදිග පවතින ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් ඇතිවූ සැපයුම් බාධාවන් හේතුවෙන් ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය තවදුරටත් වැඩි විය.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | මාර්. | අප්‍රේ. | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **66.7** | **42.6** | - | ඉහළ යෑමක සිට පහත වැටීමක් |
| නව ඇණවුම් | 69.9 | 36.4 | - | ඉහළ යෑමක සිට පහත වැටීමක් |
| නිෂ්පාදන | 68.8 | 30.5 | - | ඉහළ යෑමක සිට පහත වැටීමක් |
| සේවා නියුක්තිය | 55.9 | 47.0 | - | ඉහළ යෑමක සිට පහත වැටීමක් |
| තොග මිලදී ගැනුම් | 59.9 | 44.0 | - | ඉහළ යෑමක සිට පහත වැටීමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 75.5 | 68.7 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වන අපේක්ෂා ඉහළ යෑමක් පෙන්නුම් කළ ද, මැද පෙරදිග පවතින ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් පවතින අවදානම් පිළිබඳව සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූ බොහෝ දෙනෙකු සිය අවධානය යොමුකර තිබුණි.

**ගෝලීය ප්‍රවණතා**
**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට / කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඉන්දියාව | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් ජනපදය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් රාජධානිය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| යුරෝපා කලාපය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2026 මැයි 15 වන දිනට (PMI Releases (spglobal.com))*

[1] *එස් &පී ග්ලෝබල් (S&P Global) ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2026 අප්‍රේල් මාසයේ දී දර්ශකාංක 46.7 ක අගයක් වාර්තා කළ අතර, උත්සව සමයෙන් පසු ඇති වූ සෘතුමය බලපෑම් සහ බලශක්ති මිල ඉහළ යෑම, සේවා ක්‍රියාකාරකම්වල සංකෝචනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.**


ඉන්ධන මිල ඉහළ යෑම, උත්සව සමයේ පැවති නිවාඩු දින, සහ සංචාරක පැමිණීම් මන්දගාමී වීම, මෙම මාසයේ බොහෝ අංශවල ව්‍යාපාරික කටයුතු පහළ යෑමට බලපෑවේය. භාණ්ඩ ප්‍රවාහනය සහ අනෙකුත් පෞද්ගලික සේවා ක්‍රියාකාරකම් යන උප-අංශවල තියුණු සංකෝචනයක් වාර්තා වූ අතර, රක්ෂණ, තොග සහ සිල්ලර වෙළඳාම මෙන්ම නවාතැන් හා ආහාරපාන සේවා කටයුතුවල ද සැලකිය යුතු පසුබෑමක් වාර්තා විය.

භාණ්ඩ ප්‍රවාහනය, රක්ෂණ, තොග සහ සිල්ලර වෙළඳාම මෙන්ම නවාතැන් හා ආහාරපාන සැපයීමේ කටයුතුවල දක්නට ලැබුණු පසුබෑමත් සමඟ, 2023 අප්‍රේල් මාසයෙන් පසු ප්‍රථම වරට 2026 අප්‍රේල් මාසයේ දී නව ව්‍යාපාරවල පහළ යෑමක් දක්නට ලැබුණි.

සේවා ගිවිසුම් කාලය අවසන් වීම, විශ්‍රාම ගැනීම් සහ ඉල්ලා අස්වීම් හේතුවෙන් 2026 අප්‍රේල් මාසයේ දී සේවා නියුක්තිය පහළ ගියේය. මේ අතර, නිම කිරීමට නියමිත කාර්යයන් පෙර මාසයට සාපේක්ෂව අඩු වේගයකින් වුව ද අඛණ්ඩව පහත වැටුණි.

| සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය) | **46.7** |
|---|---|
| 2026 අප්‍රේල් | |

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | 2026 මාර්. | 2026 අප්‍රේ. | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)** | **59.4** | **46.7** | - | **ඉහළ යෑමක සිට පහළ යෑමක්** |
| නව ව්‍යාපාර | 57.6 | 48.9 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 54.2 | 44.4 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| නිම කිරීමට නියමිත කාර්යයන් | 48.1 | 48.8 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 57.1 | 65.9 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි කාර්තුව සඳහා ව්‍යාපාරික අපේක්ෂාවන් ධනාත්මක මට්ටමක පවතින අතර, එය පවතින බාධාවන් සහ ගැටුම් අවසන් වී ව්‍යාපාරික කටයුතු ස්ථාවර වනු ඇතැයි යන විශ්වාසය මත රඳා පවතී. කෙසේ වෙතත්, මැදපෙරදිග පවතින භූ-දේශපාලනික නොසන්සුන්තාව සහ පුළුල් ගෝලීය අවිනිශ්චිතතාවයන් හේතුවෙන් මෙම ඉදිරි දැක්ම විවිධ අවදානම්වලට යටත් විය හැක.

**ගෝලීය ප්‍රවණතා**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඉන්දියාව | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් ජනපදය | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| එක්සත් රාජධානිය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| යුරෝපා කලාපය | ඉහළ යෑමක සිට පහළ යෑමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2026 මැයි 15 වන දිනට*

**තාක්ෂණික සටහන:**

**ක්‍රමවේදය**

ප්‍රශ්නාවලිය ඊළඟ මාසයේ පළමු භාගයේ දී සම්පූර්ණ කෙරේ. සෑම විචල්‍යයක් සඳහාම, පෙර මාසය හා සසඳන විට වැඩි වීමක්, අඩුවීමක් හෝ නොවෙනස්ව පැවතීමක් ද යන්න වාර්තා කිරීමට ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටින අතර, යම් වෙනසක් සඳහා හේතු දැක්වීමට ඉල්ලා සිටිනු ලැබේ. දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** නිෂ්පාදන ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස සැලකෙන අතර, නව ඇණවුම්, නිෂ්පාදන, සේවා නියුක්තිය, තොග මිලදී ගැනුම් සහ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප-දර්ශකයන්ගේ භරිත සාමාන්‍යයකි.

පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සේවා ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සමඟ සැසඳිය හැකිය.

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිම කිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.